# වේවැල්කැටියේ සෙල්ලිපියෙන් හෙළි වන පැරණි ලක්දිව අපරාධ විමර්ශණ ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

වරාපිටියේ මංගල හිමි[1]

ක්‍රි. ව. දහවන සියවසට අයත් වේවැල්කැටියේ සෙල්ලිපියේ පැරණි ලක්දිව දසගම් පාලනය, අපරාධ පිළිබඳ නඩු විසඳීම, දඬුවම් දීම, අධිකරණය පිළිබඳ තොරතුරු ඇතුළත්ව ඇත. රාජ්‍ය පාලනයේදී රට, දසගම, ගම ලෙස පාලනය සංවිධානය වූ අතර බුද්ධදාස රාජ්‍ය කාලයේ ගම් දසකට වෛද්‍යවරුන් පත් කළ බව ද මහාවංශයේ දැක්වේ. ප්‍රාදේශීය පාලනයේදී අධිකරණ කටයුතු සඳහා විශේෂ අංශයක් නොතිබුණු බවත් දණ්ඩනායක අධිකරණ නායකයන තනතුරු වංශකතාවල සඳහන්ව ඇතත් රදකොල්සම්දරුවන් ආදී නිලධාරීන්ට ද අධිකරණ බලය පැවරී තිබුණු බව ආචාර්ය සුරවීර මහතා පවසයි. "දසගම ඇත්තන් හිඳ විචාර උපන්දැයට පැහැකිසේ ලියා තබන මැරුවනුමරා" (10-12 පේළි) යනුවෙන් දසගම ඇත්තන්ට මිනීමැරුම් සොරකම් කිරීම් සඳහා මරණීය දණ්ඩනය දීමට බලය තිබී ඇත. අරමුණ ක්‍රි. ව. දහවන සියවසට අයත් කාලයේ ශ්‍රී ලංකාව තුළ අපරාධ විමර්ශන ක්‍රම පිළිබඳ වේවැල්කැටියේ සෙල්ලිපියට අනුව තොරතුරු හඳුනා ගැනීම,

මෙම සෙල්ලිපියට අනුව ගම්බද උසාවි අධිකරණ ශාලා තිබී ඇත. බලය ලත් රාජ්‍ය නිලධාරීන් අධිකරණ විනිශ්චය කළ අතර නඩු තීන්දු ලියා තැබීම ද සිරිතක් විය. මරණීය දණ්ඩනය, මිනීමැරුම්, මංකොල්ලකෑම, ගවයන්, එළුවන් මැරීම, රාජ්‍ය අපරාධ කිරීම, රජ අණ මැකීම, අන්තඃපුර ස්ත්‍රීන් දූෂණය, රජ සිරුර නිකරුණේ ඇල්ලීම ආදියට මරණ දඬුවම හිමි විය. මරණ දඬුවම දෙන ලද්දේ හිස ගසා දැමීම, උල්වල රඳවා තැබීම, ඇතුන් ලවා පෑගීම ආදිය වන අතර ප්‍රසිද්ධියේ දඬුවම් දීම ද තවත් ලක්‍ෂණයකි.

මෙම ලිපියට අනුව දසගම තුළ මංකොල්ල කෑම් සිදු වුව හොත් දින හතලිස් පහක් ඇතුළත සොරුන් අල්වා දීමට ගමම බැඳී සිටියි. එසේ නොවුන හොත් රන් එකසිය විසි පහක කළඳක් දඩ ගෙවිය යුතුය. තුවාල සිදු කිරීමට රන් පනහක කළඳක් ගෙවිය යුතු අතර අපරාධකරු අල්වා ගැනීමට නොහැකි වුවහොත් ගෙවල් රාජසන්තක කළ යුතුය. ගවයන්, එළුවන් සොරකම් කරන්නන්ගේ කිසිලිවල හන ගැසීය. එමෙන් ම රජ අණ කැඩුවහොත් රත් කරන ලද යකඩ සෙරෙප්පුවල සිටු වීම කළ යුතුය. ගව හොරුන්ට දඬුවම් නොලැබීමට නම් යපුවරු මත නැඟ දිව්රිය යුතුය. මෙම සෙල්ලිපියේ පැරණි ලක්දිව මෙබඳු දඬුවම් ක්‍රම පිළිබඳ සඳහන් වන අතර සාහිත්‍යය හා පුරාවිද්‍යා වාර්තා මගින් තවත් දඬුවම් රාශියක් තිබී ඇත.

"මැ ඇත්තන් පන්සාලිස් දවසෙකින් සොයා ගෙනැ පටිවනු- කොට් ඉසා නොපොහොත් ගෙදඩි ගන්නා කොට් ඉසා -තිරු"

ලෙස සීමිත කාලයක් තුළ වරදකරුවන් ඇල්ලීමේ සාමූහික වගකීම, එය ඉටු කිරීමට නොහැකි වූ විට ගමටම දඩ ගැසීම, වැරදිවලට වන්දි ගෙවීම, ආදිය ඉංග්‍රීසි ඉතිහාසයේ "සැක්ෂන්හානෝමන්" යුවළ පැවති "බෝට්හෝවයිට්" ආදි ඉංග්‍රීසි පරිපාලන ලක්‍ෂණ සිහිපත් කරන බව ආචාර්ය වික්‍රමසිංහයන් පවසයි.

1 B.A. (Hons)usjp, M.A (BPU), Diploma in Edu. (OUSL)
ගංගොඩවිල සුභද්‍රාරාම පිරිවෙන් විද්‍යායතනයේ ආචාර්ය
mwarapitiya@yahoo.com

"උපන් දූයටි පැහැ කිසේ ලියා තබා" දඩුවම් දිය යුතු බව සඳහන් වන අතර එය පොදු මිනිස් අයිතිවාසිකම් රැකීමට ගත් පියවරක් ලෙස සඳහන් කළ හැකිය. පාලකයන්ට ද නීතියට පිටින් යමක් කළ නොහැකිය. නඩුතීන්දුව ගැන සෑහීමට පත් නොවන්නේ නම් ඇපැල් කිරීමේ බලය ද හිමි වී ඇත. මෙය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වන අතර නිරත්තරයෙන් සාමූහික වගකීම පෙන්වා දිය හැකිය.

දසගම් තුළ යුක්තිය පසිඳින ලද්දේ රාජ සභාවේ ප්‍රධානියා වන රජුගේ අණසකට යටත්ව මූලදැනීන්ගෙන් හා වගකීමක් ඇති ගම් වැසියන්ගෙන් සැදුණු මහජන උසාවියකින් බව මෙම සෙල්ලිපියෙන් තහවුරු වෙයි. බරපතල ආරවුල් නිරාකරණය කිරීමටත් අලුත් නීති පැණවීමටත්, රජයේ ආදායම නියම ලෙස එකතු කෙරේදැයි බැලීමටත් අවුරුදු පතා රටේ සංචාරය කිරීමේ සිරිත තිබී ඇත.

"කඩ පළා සොරකම් කළ තිරුකොට් ගෙනැ දස ගැමැ ඇත්තන් හින්ද විචාරා උපන් දූයටි පැහැකිසෙ ලිය"

මෙය නෝමන්වරුන්ගේ කියුරියාරෙජිස්හි ඃඔයැ ජමරස්රුටසි* සාමාජිකයන් හෝ සංචාරක විනිශ්චයකරුවන්ගේ කාර්ය මදක් සැසඳෙන බව ආචාර්ය වික්‍රමසිංහයන් පවසයි. මේ කරුණු ගැන සිතා බලත්ම රටවැසියාව සඳහා වූ ප්‍රජාතන්ත්‍රවාදී පාලන සංවිධානයක් ක්‍රි. ව. 10 සියවස් පැරණි ලංකාවේ නොතිබුණේ නමුත් ප්‍රජාත්නත්‍රවාදයේ මූලික ලක්ෂණ කිහිපයකින් යුක්ත පාලන සංවිධානයක් තිබූ බව වේවල්කැටිය සෙල්ලිපිය මගින් තහවුරු වෙයි.

ප්‍රමුඛ පද ඃ